

තල්, පොල් සහ මුතු පබා - 17

## බ්‍රිතාන්‍ය සංචාරකයා කුතුහලයට පත් කළ ආදම් ගේ කන්ද - 4

ශ්‍රියා කුමාරසිංහ - නවසීලන්තයේ සිට




**වර්තමාන** ලෝකයේ ශ්‍රී පාද ස්ථානය වැනි පෞරාණික විශ්වාසයක් මත පදනම් වී පුද පූජා කෙරෙන වෙනත් වස්තුවක් නොමැතිය. නමුත්, ආදම් මිහිපිට පළමු මිනිසා වුවද මේ භෞතික ලෝක ගෝලය මත සදා නොමැකෙන සළකුණක් තබා ඇති මිනිසෙකු ලෙස සැලකෙන්නේ ඔහු පමණක්ම නොවන බව මා මගේ පාඨකයන්ට මතක් කර දිය යුතුය. නොයෙකුත් බාධක වලට මුහුණ දී ආපසු පැමිණි අපේ ආදි මිත්‍රයා වන හෙරඩිටස්, සයිති හි කන්දක හර්කියුලීස්ගේ දැවැන්ත පා සළකුණ තිබෙනු සිය දෑසින්ම දුටු බව කියා සිටී. කෙසේ හෝ එය පසුකාලීන සංචාරකයින්ගේ නෙතට හසුවී නැත. ඩමස්කස් හි ඇති මහා කෝවිලේ මෝසස්ගේ පා සළකුණයයි කියා සිටින සටහනක් සහිත ගල් පුවරුවක් තිබේ. ඔබට සාන්ත තෝමස්ගේ පා සළකුණ එහි සැබෑ ප්‍රමාණයෙන්ම දැක ගන්නට ඔනෑ නම් එය ඔහුගේ අනුගාමිකයින්ගේ හදවත්වලටත් වඩා ඝන ද්‍රව්‍යයක් මත තබා තිබෙනු ඉන්දියාවේ බිහාරයේ දී දැකගත හැකිය. එට්නා කන්ද පාමුල සැටනියාහි ඇති ජාතික වීරයන්ගේ අනුස්මරණ චතුරස්‍රයේ සාන්ත අගතාගේ පිළිරුවක් ඇත. ඊට යාබදව ඇගේ සිර මැදිරිය තිබුණු ස්ථානයේ ඉදිකොට ඇති සාන්ත කාසරි දේවස්ථානයේ ඇගේ පා සළකුණ දක්නට ලැබේ. අවාසනාවන්ත ඉරණමකට ලක්වූ මැක්සිකෝවේ නිර්භීත අධිරාජයා, මොන්ටේසුමා ගේ සළකුණ රතු පැහැති ඝන පළිඟු පතුරක් මත තබා තිබේ. සියම් රාජ්‍යයේ, බැංකොක් වලට ආසන්නයේ පිහිටි ගමක ද ජේරුසෙලමේ ඉපැරණි හෙලේනා කතෝලික සභාව පිහිටි බිමේ තිබෙන ස්වර්ගාරෝහණ දෙව් මැදුරේ තිබෙන ආකාරයේ ශුද්ධ වු සළකුණක් ඇති නමුදු එය කාගේදැයි කියන්නට මම නොදනිමි.

මගේ අත්දැකීමේ හැටියට නම් ආදම්ගේ කන්ද නැගීම ඒ හා සමාන බෑවුමකින් යුතු වෙනත් ඔනෑම කන්දක් නගිනවාට වඩා දුෂ්කරය. බොහෝ තැන් ගල් බොරළු සහිත තියුණු බෑවුම්ය. මුදුන ආසන්නයේදී ලිහිල්ව එල්ලෙන දම්වැල්වල ආධාරයෙන් සරඹ සංදර්ශකයින් මෙන් කන්ද තරණය කිරීමට ගත යුතු ආයාසය ගැන කතා කිරීම පසෙකින් තබමු. ඊටත් වඩා ගමනේ මුල් පැය කීපය යා යුතු මාර්ගය වැටී ඇති වන රාජ්‍යය තුල උතුරන දාහය මැදින් ඇවිදීමේදී දැනෙන වෙහෙස කියා නිම කල නොහැකිය. සාමාන්‍යයෙන් කඳු නැගීමකදී ඇති අපහසුකම් වලට අමතරව දැනෙන මේ වෙහෙසත් ලේ පිපාසයෙන් පෙළෙන කුඩැල්ලන් බහුල ලෙස සිටීමත් නිසා ඇතිවන විඩාව යන කරුණු මා දෙවන වතාවටත් මේ කන්ද තරණය කිරීමට පෙළඹීමෙන් වැලැක්වීම සඳහා ඔනෑවටත් වඩා ප්‍රමාණවත්ය.

ජනවාරියේ එක්තරා උදෑසනක ඉර නැගෙන්නට බොහෝ වේලාවකට කලින් මම රත්නපුරයෙන් ගමන් ඇරඹුවෙමි. එය කොළඹ සිට සැතපුම් හතලිහක් පමණ දුරින්, කළු ගඟේ දකුණු ඉවුරේ, සරු ගස් කොළන් වලින් ගහණ කඳු වලින් වටවූ, හරිත වර්ණ තැනිතලාවක පිහිටි නගරයකි. එම පහත් බිමේ වනගත පෙදෙසට ඇතුළු වෙද්දී ඉර තවම විදේශගතව සිටියද, ගතට දැනුණු උෂ්ණත්වය මා තුල ඇති කල එකම අභිලාෂය නම් හැකි තරම් ඉක්මණට හැකිතාක් උස්බිමට යා හැකි වන පරිදි දෙපා කඩිනම් කිරීමය. ඉතාමත් සැහැල්ලු ඇඳුමින් සැරසී සිටියද ඒවා ඔනෑවටත් වඩා වැඩි බව දැනුණි. මා සමග පැමිණි කුලීකරුවාගේ නිරාවරණ පිට සහ පාවහන් රහිත දෙපා දෙස මා බැලුවේ ඊර්ෂ්‍යා සහගතවය. සැතපුම් බාගයක් යන්නටත් පෙර මම අධික තෙහෙට්ටුවට පත් වී සිටියෙමි. එම සෞඛ්‍ය තත්වය යටතේ මට ඉදිරියේ මුහුණ දීමට ඇති තත්වය දැන සිටියේ නම් නොවරදවාම මම මගේ දුර්වල පරාජය බාරගෙන මෙතැන් සිට ගෙන එන විස්තරය ලියා තැබීමට මේ පෑන වෙනත් අයෙකුට බාර දෙන්නට තීරණය කරනු නිසැකය. මට මේ ගමනේදී විඳින්නට සිදු වු අනතුරුදායක අත්දැකීම් හා සසඳන කල එය දහස් වරක් වටනේය.

ගමන් මග වැටී ඇත්තේ විශාල වශයෙන් පිපී ඇති නිල් කටරොළු මල්, බාඳුරා මල්, ඔකිඩ්, බට පඳුරු හා රිදී පැහැයෙන් යුතුව ගස් වලින් එල්ලා වැටෙන, එහෙත් සඳ එළියට පැහැදිළිව හඳුනා ගත නොහැකි දහස් ගණනින් වු මල් ගොමු මැදිනි. නගරයේ සිට සැතපුමක් ගිය තැන ගඟට ඉහලින් ගස් සහ මල් වැල් වලින් වැසී ගිය ගල්තලාවලින් වටවී තිබුණු බලංගොඩ විහාරය පසු කලෙමු. තවත් සැතපුම් තුන හතරක් ගිය තැන ගිලීමලේ ට ළඟා වීමට හැකි විය. ඇත්තෙන්ම එම දුර මට නම් සැතපුම් දහයක දුරක් සේ දැනුණි. ගිලීමලේ යනු තාල වර්ගයේ ගස් වලින් පිරුණු, අවට කුඩා කඳු ගැට සම්පූර්ණයෙන්ම කොළ පැහැයෙන් වැසී ගිය, සැතපුම් බාගයක් පමණ වට ප්‍රමාණයකින් යුත් ඉතා ආකර්ශනීය පටු තැනිතලා ස්ථානයකි. රාත්‍රියේ උණුසුම් වාතය හේතුකොට ගෙන ඒ වෙලාවේ එහි දක්නට ලැබුනේ අඳුරු අප්‍රසන්න ස්වභාවයකි. එතැන් සිට උදෑසන හිරු කිරණ තුරු මුදුන් මත පතිත වන තෙක් අපට ගෙවන්නට සිදු වුයේ ශීඝ්‍ර නැග්මකින් යුත් මගකි. ඉන් සුළු වේලාවකට පසුව දීප්තිමත් හිරු එළියෙන් මුළු ප්‍රදේශයම නැහැවී දවස උදා වී තිබුණි. තබන හැම පියවරක් පාසාම වඩ වඩාත් පියකරු දසුන් දැක ගන්නට ලැබුණි. විශාල ලෙස වැඩී ගිය වැල් අතරින්, වැලි තලා මතින්, හා හෝ හඬදී ගලා බසින කළු ගඟේ දිය සෙවල බැඳි ගල් පර මතින් ගමන් මග හෙළි කර ගනිමින් ඉදිරියට ගොස් අඩි 1500ක උසින් පිහිටි පැල්මඩුල්ල ට ළඟා වී මෙතෙක් ඇගේ එල්ලී සිටි කුඩැල්ලන් ඉවත් කොට ගිමන් හරින්නට නතර වුනෙමු. එතැන් සිට ගෙවු සැතපුම් අටක දුර ප්‍රමාණය නම් ගෙවා ගත්තේ සිත




**ඔබේ** වැඩිමහළු දරුවා උපන් දවස ඔබට මතකද? අමතක වන්නට විදියක් නැත. නමෝ විත්තියෙන් මව් පදවිය හෝ පිය පදවිය ලැබූ දවස අමතක වන්නේ කාටද? එහෙත් ජීවිතයේ බොහෝ දුක්ඛ දෝමනස්සයන්ට මුහුණ දෙමින් වියපත් වන අපට එදා ලොකු ළමයා අපේ සිත් වලට ගෙනා සතුට ගැන නැවත මෙනෙහි කරන්නට වේලාවක් නැත.

ලොකු ළමයා එක අතකින් වාසනාවන්තය. කුළුදුල් දරුවා නිසා මාපියන්ගේ පමණක් නොව, ආච්චිලා සීයලාගේත්, නැන්දලා මාමලාගේත් අසීමිත ආදරයට ලක්වන්නේ ලොකු ළමයාය. මුල් අවදියේ වැඩියෙන්ම සුරතලය ලබන්නේත්, තෑගි බෝග වලට හිමිකම් ලබන්නේත් ඔහු හෝ ඇයය. දුප්පත්ම පවුලක වුනත් අඩු තරමින් ඔඩිකොලෝන් බෝතලයක්වත් ලැබෙන්නේ ලොකු ළමයාටය. එහෙත් වැඩිමලෙකු වී ඉපදීම කරුමයක් වන්නේ දෙවැන්නෙකු පවුලට එක්වීමෙන් පසුවය.

ආදරය අඩුවක් නොවුනත්, දෙවැන්නෙකු උපන් පසු ලොකු ළමයාට පුංචි කෙණෙහිලි කම් අප අතින් සිදුවන බව අප අකමැත්තෙන් වුවද

*ලොකු ළමයා සාර්ථක කෙනෙකු නොවන්නට පුළුවන. එහෙත් ඔහු හෝ ඇය පවුලට ලෙන්ගතුය. නෑදෑයින්ට හිතවත්ය. ගැහැණු දරුවෙකු නම් අම්මාට බැරිවුණු වෙලාවට පරිප්පු හොද්දක් (මේ රටවල නම් නූඩ්ල්ස් පැකට් එකක්) වත් හදා දෙන්නීය.*

පිළිගත යුතුව ඇත. බාලයා ඇඬෙව්වත්, වැට්ටෙව්වත් බැණුම් අහන්නේ ලොක්කාය. ඒත් සුළු මොහොතකට හෝ බාලයා බලාගන්නට වන්නේත් ලොක්කාටමය. ඊළඟට අප කරන්නේ මේ කිරි සප්පයින්ට නැති වැඩිහිටි කමක් ආරූඪ කර, වැඩිහිටියෙකුගේ හැසිරීම ඔවුන්ගෙන් බලාපොරොත්තු වීමයි.

""මල්ලි ඔයාට ගැහුවෙ එයාට තාම තේරෙන්නැති හින්දනෙ. ඔයා ලොකු ළමයා දැන ගන්න එපායැ මල්ලිට ගහන්න හොඳ නෑ කියලා"" කිසිම හිරිකිතයක් නැතිව අප මේ කතාව කියන්නේ අවුරුදු 2 -- 5 තරම් වයසේ සිඟිත්තන්ටය. බාල වියේ සිටම අප උත්සාහ කරන්නේ ලොකු ළමයා නිවටයෙකු කරන්නට නොවේද? මේ අසාධාරණයට එරෙහිව ලොකු ළමයා නැගී සිටියොත්, ඔහු හිතුවක්කාරයෙකි. බාලයින් හිතුවක්කාර වනවාට වඩා අපේ ඇඟට දැනෙන්නේ ලොක්කා හිතුවක්කාර වුණු විටය. මන්ද යත්, අපේ අසාධාරණ තක්සේරුවට අනුව බාල දරුවන්ට ආදර්ශයක් වන ආකාරයට ලොක්කා හැසිරිය යුතු බැවිනි.

යම් හෙයකින් ලොකු ළමයා අප බලාපොරොත්තු වන ආකාරයේ ශාන්ත දාන්ත තීන්ත කූඩුවක් ලෙස හැදුනොත්, ඔහුට හෝ ඇයට මේ තරඟකාරී සමාජය හා කරට කර ඉන්නට බැරිවෙයි. වගකීමක් නැතිව දඩි බිඩි සෙයියාවෙන් හැදෙන බාල දරුවන් වැඩිමලා අබිබවා යනවිට අප චෝදනා කරන්නේද ලොකු ළමයාටය.

"ජේනව නේද නංගියි මල්ලියි? ඔයාට තමයි බැරි""

### ශ්‍රියානි පෙරේරා

බොහෝ පවුල් වල බාල දරුවෝ කෙසේ හෝ තමන්ගේ වැඩේ කර ගන්නට දනිති. ඔවුන්ගේ සාර්ථකත්වයේ රහස එතැනය. අපේ යටි සිත් ඒ බව දනිතත් උඩු සිත එය පිළිගන්නට කැමති නැත.

"කවුරු හිටියත් අපිට ඉතින් කවදහරි ලොකු ළමයගෙ පිහිට තමයි"" කියන දෙමව්පියන් පවා පුරාජේරුව කියවන්නේ හොඳින් ඉගෙන ගන්නා, ලොකු රස්සාවක් කරන, එසේත් නැතිනම් පිටරට ඉන්නා බාල දරුවන් ගැනය. මොන තරම් අසාධාරණද?

ලොකු ළමයා සාර්ථක කෙනෙකු නොවන්නට පුළුවන. එහෙත් ඔහු හෝ ඇය පවුලට ලෙන්ගතුය. නෑදෑයින්ට හිතවත්ය. ගැහැණු දරුවෙකු නම් අම්මාට බැරිවුණු වෙලාවට පරිප්පු හොද්දක් (මේ රටවල නම් නූඩ්ල්ස් පැකට් එකක්) වත් හදා දෙන්නීය. පිරිමි දරුවෙකු නම් පියාගේ වැඩකට අත ගහන්නට ඉදිරිපත් වන්නේය. එහෙත් වැඩ වැරදුණු විට පරිප්පු කන්නට වන්නේද ඒ ළමයින්ටමය.

මම යළිත් කියමි. ලොකු ළමයා සාර්ථක කෙනෙකු නොවන්නට පුළුවන. එහෙත් කලකට ඉහත අපගේ සිත් වලට අසීමිත සතුටක් ගෙනෙමින් මෙලොවට බිහිවුණු සිඟිත්තාම නොවෙද ඒ? එතරම් සතුටක් ඔබ ලැබූ වෙනත් දිනයක් ඔබට සිහි කළ හැකිද? පසු කලෙක කිරි සිහින දකිමින් තොටිල්ලේ නිදා සිටියදී ඒ දෙතොල් මත රැ දුණු සුරතල් සිනහව, උඩු තොල මත පෙළ ගැසී තිබුණු දහඩිය බිංදු හෝ නලලට වැටී තිබුණු කෙස් රොද ඔබට අමතක නැහැ නේද? ඔහු හෝ ඇය දැකීම පවා අපට මොන තරම් සතුටක් වීද?

එහෙත් ජීවිතයේ අනෙකුත් පටලැවිලි මැද ඒ සතුට දියවී ගිය පසු ලොකු ළමයා නිසි ඇගයීමකට ලක් නොවුණු බව අප බොහෝ දෙනෙකුට පිළිගන්නට සිදුවනවා ඇත. දැන් ඔබ ඉදිරියේ සිටින නාඹර තරුණිය හෝ දැළි රැ වුල් වැඩුණු ඉලන්දාරියාගේ ශරීරය තුළ, එදා ඔබේ දිවි බඳුන සෙනෙහසින් පිරවූ ඒ කිරිකැටියා තවමත් ජීවත්වන බව සිහිපත් කර ගන්නට ඔබ තවමත් ප්‍රමාද වැඩි නැත.

ලොකු දුවේ! ලොකු පුතේ! ජීවිතයේ එක් වතාවක් පමණක් ලැබිය හැකි අප්‍රමාණ සතුටක් අත් විඳින්නට අපට ඉඩ සලසා දීම ගැන ඔබට අනේක වාරයක් ස්තුතියි! අතපසුවීම් ගැන සමාවන්න!